13
පාඩම
त्रयोदशः पाठः

# අතීතකාල ආඛ්‍යාත

**අතීත කාලය - අනද්‍යතනාතීත 'ලඞ්'**

| | | | |
|---|---|---|---|
| पचति | - උයයි | अपचत् | - ඉව්වේ ය. |
| गच्छति | - යයි | अगच्छत् | - ගියේ ය. |

අනද්‍යතනාතීත 'ලඞ්' පරස්මෛ පද - ප්‍රත්‍යයමාලාව

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | त् | ताम् | अन् |
| मध्यमपुरुष | स् (:) | तम् | त |
| उत्तमपुरुष | अम् | व | म |

पचति = උයයි        (अ) पच (त्) = ඉව්වේ ය.

↑ මුලට අයන්න        ↑ අගට අතීත ප්‍රත්‍යය

## 13.1 ක්‍රියාකාරකම

වර්තමාන ක්‍රියාපදවල අතීත ක්‍රියාරූප කිහිපයක් පහත දැක්වේ. ඒවා දෙස හොඳින් අවධානය යොමු කර අතීත 'ලඞ්' ක්‍රියාපද පරස්මෛපදයේ වරනඟා පුහුණු වන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| भवति | - | වෙයි | अभवत् | - | විය |
| पचति | - | උයයි | अपचत् | - | ඉව්වේ ය |
| वन्दति | - | වඳියි | अवन्दत् | - | වැන්දේ ය |
| यच्छति | - | දෙයි | अयच्छत् | - | දුන්නේ ය |
| पिबति | - | බොයි | अपिबत् | - | බිව්වේ ය |
| तिष्ठति | - | සිටියි | अतिष्ठत् | - | සිටියේ ය |
| खादति | - | කයි | अखादत् | - | කෑවේ ය |

වරනැඟීම

## 13.2 ක්‍රියාකාරකම

√पच् ධාතු සිද්ධ 'ලඞ්' අනද්‍යතනාතීත පරස්මෛ පද වරනැඟීම

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | अपचत् | अपचताम् | अपचन् |
| | පිසුවේ ය | (දෙදෙන) පිසුවෝ ය | පිසූහ |
| मध्यमपुरुष | अपचः | अपचतम् | अपचत |
| | පිසුවෙහි | (දෙදෙන) පිසුවෙහු | පිසුවෙහු |
| उत्तमपुरुष | अपचम् | अपचाव | अपचाम |
| | පිසුවෙමි | (දෙදෙන) පිසුවෙමු | පිසුවෙමු |

### විශේෂ

සිංහල භාෂාවේ ස්ත්‍රීලිංග ඒකවචන නාමපදයක් උක්තය වශයෙන් යෙදුණු විට ආඛ්‍යාතය තරමක් වෙනස් ව යෙදේ. සංස්කෘතයේ එසේ නොවේ.

| උදා: පුල්ලිංග | ස්ත්‍රීලිංග |
|---|---|
| पिता गृहम् अगच्छत्। | माता गृहम् अगच्छत्। |
| පියා ගෙදර ගියේ ය. | මව ගෙදර ගියා ය. |
| उपासकः बुद्धम् अवन्दत् | उपासिका बुद्धम् अवन्दत्। |
| උපාසකයා බුදුන් වැන්දේ ය. | උපාසිකාව බුදුන් වැන්දා ය. |

**අතීතකාල ක්‍රියා යොදා සෑදුණු සරල වාක්‍යය උගනිමු.**

| | | | | |
|---|---|---|---|---|
| प्र. पु. | अम्बा | ओदनम् | अपचत्। | මව බත් පිසුවාය. |
| | अम्बे | ओदनम् | अपचताम्। | මව්වරු දෙදෙන බත් පිසුවෝය. |
| | अम्बाः | ओदनम् | अपचन्। | මව්වරු බත් පිසූහ. |
| म. पु. | त्वम् | अक्रीडः। | | නුඹ/තෝ සෙල්ලම් කළෙහි. |
| | युवाम् | अक्रीडतम्। | | නුඹලා/තෙපි දෙදෙන සෙල්ලම් කළෙහු. |
| | यूयम् | अक्रीडत। | | නුඹලා/තෙපි සෙල්ලම් කළෙහු. |
| उ. पु. | अहम् | अगच्छम्। | | මම ගියෙමි. |
| | आवाम् | अगच्छाव। | | අපි දෙදෙන ගියෙමු. |
| | वयम् | अगच्छाम। | | අපි ගියෙමු. |


නොමිලේ බෙදහැරීම සඳහා ය.

## 13.1 අභ්‍යාසය

1. ඔබ කැමැති ක්‍රියාපද දෙකක් පමණක් **'ලඞ්' පරස්මෛ පදයෙහි** වරනගන්න.

2. පහත දැක්වෙන **අනද්‍යතනාතීත** 'ලඞ්' ක්‍රියාපදවල පුරුෂය, වචනය හා තේරුම දක්වන්න.

| | | පුරුෂය | වචනය | තේරුම |
|---|---|---|---|---|
| १ अगच्छत् | - | ......................... | ......................... | ......................... |
| २ अवन्दताम् | - | ......................... | ......................... | ......................... |
| ३ अयच्छः | - | ......................... | ......................... | ......................... |
| ४ अपठम् | - | ......................... | ......................... | ......................... |
| ५ अचोरयन् | - | ......................... | ......................... | ......................... |
| ६ अखादत | - | ......................... | ......................... | ......................... |
| ७ अतिष्ठाम | - | ......................... | ......................... | ......................... |
| ८ अपिबत | - | ......................... | ......................... | ......................... |
| ९ अवदाव | - | ......................... | ......................... | ......................... |
| १० अपुष्यन् | - | ......................... | ......................... | ......................... |

3. පහත දැක්වෙන **අතීත ක්‍රියාපද** සංස්කෘතයට හරවා දේවනාගරී අකුරින් ලියන්න.

i. දිව්වේ ය ................................................
ii. පිසුවා ය ................................................
iii. (දෙදෙන) හමු වූහ ................................................
iv. ගියෙහි ................................................
v. සිටියෙමි ................................................
vi. (දෙදෙන) කෑවෙහු ................................................
vii. බීවෙමු ................................................
viii. (දෙදෙන) ක්‍රීඩා කළෙහු ................................................
ix. මිදූහ ................................................
x. (දෙදෙන) ලිව්වෙමු ................................................

## 13.2 අභ්‍යාසය

1. පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟන්න.

१ बालकः अक्रीडत्।
२ बालिका अचिन्तयत्।
३ चोरौ धनं अचोरयताम्।
४ अहं बुद्धम् अवन्दम्।
५ लुब्धकाः वनं अगच्छन्।
६ अम्बा ओदनं अपचत्।
७ त्वं कथां अकथयः।
८ वयं मुखानि अक्षालयाम।
९ उपासिका दारिद्राय आहारम् अयच्छत्।
१० नृपतिः सेनापतिभिः सार्धं रिपून् अजयत्।

2. පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අක්ෂරවලින් ලියන්න.

1. මව **නිදාගත්තා ය.**
2. වඳුරෝ දෙදෙන **සෙල්ලම් කළහ.**
3. අපි අකුරු **ලිව්වෙමු.**
4. ළමයි බුදුන් **වැන්දහ.**
5. නුඹලා චිත්‍රය **දුටුවෙහු.**
6. බල්ලා සඳට **බිරුවේ ය.**
7. භික්ෂුව දහම් **දෙසීය.**
8. අපි දෙදෙන ගී **ගැයුවෙමු.**
9. බිරිඳ ස්වාමියාට පුවතක් **කීවා ය.**
10. අම්මා තාත්තා සමග පන්සලට **ගියා ය.**

## අභ්‍යාස සඳහා උපකාරක පද

**ක්‍රියාපද**

| | | | | | |
|---|---|---|---|---|---|
| क्रीडति | - | සෙල්ලම් කරයි | अक्रीडत् | - | සෙල්ලම් කළේ ය |
| पठति | - | පාඩම් කරයි | अपठत् | - | පාඩම් කළේ ය |
| लिखति | - | ලියයි | अलिखत् | - | ලියුවේ ය |
| वन्दति | - | වඳියි | अवन्दत् | - | වැන්දේ ය |
| पश्यति | - | බලයි | अपश्यत् | - | බැලුවේ ය |

| | | | | | |
|---|---|---|---|---|---|
| मिलति | - | හමුවෙයි | अमिलत् | - | හමුවූයේ ය |
| जयति | - | දිනයි | अजयत् | - | දිනුවේ ය |
| गायति | - | ගයයි | अगायत् | - | ගැයුවේ ය |
| भषति | - | බුරයි | अभषत् | - | බිරුවේ ය |
| मुञ्चति | - | මුදයි | अमुञ्चत् | - | මිදුවේ ය |
| रचयति | - | රචනා කරයි | अरचयत् | - | රචනා කළේ ය |
| ताडयति | - | තළයි | अताडयत् | - | තැළුවේ ය |
| चोरयति | - | සොරකම් කරයි | अचोरयत् | - | සොරකම් කළේ ය |
| क्षालयति | - | සෝදයි | अक्षालयत् | - | සේදුවේ ය |
| पूजयति | - | පුදයි | अपूजयत् | - | පිදුවේ ය |
| कथयति | - | කියයි | अकथयत् | - | කීවේ ය |

නාමපද

| | | | | | |
|---|---|---|---|---|---|
| लेखक (පු) | - | ලේඛකයා | अम्बा (ස්ත්‍රී) | - | මව |
| लुब्धक (පු) | - | වැද්දා | दारिका (ස්ත්‍රී) | - | ළදැරිය |
| सेवक (පු) | - | සේවකයා | उपासिका (ස්ත්‍රී) | - | උපාසිකාව |
| बलिवर्द (පු) | - | ගොනා | भार्या (ස්ත්‍රී) | - | බිරිඳ |
| उद्यानपालक (පු) | - | උයන්පල්ලා | कथा (ස්ත්‍රී) | - | කතාව |
| सेनापति (පු) | - | සෙන්පතියා | वार्ता (ස්ත්‍රී) | - | පුවත/ප්‍රවෘත්තිය |
| कपि (පු) | - | වඳුරා | गीत (න) | - | ගීතය |
| यति (පු) | - | භික්ෂුව | मुख (න) | - | මුහුණ |
| नृपति (පු) | - | රජු | धन (න) | - | ධනය |
| शिशु (පු) | - | ශිෂ්‍යයා | पुष्प (න) | - | මල |
| रिपु (පු) | - | සතුරා | चित्र (න) | - | චිත්‍රය |
| इन्दु (පු) | - | සඳ | उद्यान (න) | - | උයන |

භාවිතයට

**पुस्तकस्था च या विद्या - परहस्ते च यद्धनम् ।**
**कार्यकाले समायाते - न सा विद्या न तद्धनम् ॥**

පොතෙහි ඇති දැනුම ද අනුන් අත ඇති ධනය ද කටයුතු පැමිණි කල ඒ දැනුම, දැනුමක් ද ඒ ධනය, ධනයක් ද නොවේ.